

# උද්‍යාන අලංකරණ සඳහා ශා

උද්‍යාන අලංකරණ කටයුතු වලදී පාරිසරික අගය වැඩිකර ගැනීමට වඩාත් අත්‍යාවශ්‍ය වන සාධකය වන්නේ ශාකයි. උද්‍යාන නිර්මානකරණය ගැන අදහස් දක්වන්නෙකුට දෘඪ හා මෘදු අංග ලෙස අප කරන නිර්මාණය කොටස් වලට වෙන් කර ගැනීමට සිදුවනවා. එනම් උද්‍යානයේ අත්‍යාවශ්‍ය අංග ලෙස ගොඩනැගිලි, පාරවල්, තාප්ප, පඩිපෙලවල් අන්තර්ගත වන අතර අලංකාර දෘඪ අංග ලෙස දියඇලි, පොකුණු, බංකු, ආරුක්කු, මැසි, පිළිම ආදිය නිර්මාණය කරනු ලැබේ. නමුත් වටපිටාවට එක්කරනු ලබන පඳුරු, පැළෑටි, ශාක, බිම් ආවරණ වැනි අංග වලින් ලැබෙනුයේ ඉතාම චමත්කාරයක්. එබැවින් භූමි අලංකරණය සිදුකිරීමේදී මෙම ස්වභාවික අලංකරණය රඳවා ගැනීමට ශාක භාවිතය ඉතාම වැදගත් වේ.

උද්‍යාන අංග සැලකීමේදී මල් පාත්ති, මල් ගොමු, වැටවල්, තෘණ පිට්ටනි, මල් පැළ, පඳුරු, විශාල හා මධ්‍යම ශාක ලෙස උද්‍යානය තුළ විවිධාකාරයෙන් මෘදු අංග ස්ථාන ගත කරයි. මෙම ස්ථාන ගත කිරීමේදී සැලැස්මට අනුව නියම ස්ථානයේ අංගය පිහිටුවා ගැනීම ඉතාම වැදගත්. එසේම එම පිහිටුවාගත් ස්ථානයට අනුව අදාල ශාක තෝරා ගැනීමත් ඒ සඳහා, එම ශාක ස්ථාන ගතකරන තැන්වල පාරිසරික සාධක සලකා බැලීමත් ඉතාම වැදගත් වේ. ඒකියන්නේ ශාකයට ලැබෙන හිරුඑළිය, සෙවන, වර්ෂාව, සුළං, ඉඩකඩ ආදියත් පසේ ස්වභාවය ලෙස ජලවහනය, පසේ ගැඹුර, වයනය, ව්‍යුහය, සාරවත්භාවය ගැනත් අදහසක් නිර්මාණය සිදු කරන පුද්ගලයා තුළ පැවතිය යුතුයි. ඒ අනුව අදාළ ශාක, පැළ වර්ග තෝරා ගැනීම සිදු කළ හැකිය.



# ක භාවිතය

පැළ තේරීමේදී මුලින්ම එම ශාකය පරිසරයේ පවතින කාලය අනුව වර්ගීකරණය සිදුකරනු ලබයි. එනම් වාර්ෂික හා බහු වාර්ෂික ලෙසය. සූර්යාලෝකය ප්‍රියකරන වාර්ෂික ශාක ලෙස හොඳින් වර්ණ ලැබෙන මල් පැළ වර්ග තෝරා ගැනීමෙන් අලංකාරය වැඩිකර ගත හැකිය. දීප්තිමත් වර්ණ සහිත මල් පැළෑටි වර්ග තෝරා ගැනීම මෙහිදී සඳහන් කළ හැක. එසේම සෙවන ස්ථානයක් නම් එම පරිසරයට ගැලපෙන ශාක තෝරා ගත යුතුය. උද්‍යාන නිර්මාණයේදී වාර්ෂික ශාක තෝරා ගැනීමේදී වැඩි කාලයක් රඳවා ගැනීමට හැකි හා අඩු නඩත්තුවක් ඇති ශාක පැළෑටි තෝරා ගත යුතුයි. වාර්ෂික මල් පිපෙන පැළෑටි වර්ග ලෙස Salvia, Aster, Celosia, Petunia, Phlox, Merigold, Cosmos, Gomprina, Gailadia, Clemo වැනි ශාක කිහිපයක් සඳහන් කළ හැක.



Salvia



Phlox



Petunia




Galiadia




Aster



Cosmos



Celosia



Gomprina



Merigold




Clemo


Allamanda


Boganvilla


Galpimia


Pentas



Plumbogo


Cossandra


Catheranthus


Isora


Barleria


Lantana

බහුවාර්ෂික මල් පිපෙන ශාක ලෙස Galpimia, Allamanda, Ixora, Pentas, Baleria, Cossandra, Lantana, Plumbogo, Catheranthus, Boganvilla වැනි ශාක කිහිපයක් සඳහන් කළ හැක.

මෙවැනි ශාක තීරණය කිරීමේදී ආලෝකය පිළිබඳ හොඳින් සලකා බැලිය යුතුය. මෙවැනි ශාක භාවිතයේදී මල් පාත්ති, බෝදර, පේලි ආකාරයට, පඳුරු ආකාරයට සිටුවා ගැනීමෙන් තමන්ට අවශ්‍ය අංගය සූදානම් කළ හැක.

මීට අමතරව පඳුරු සිටුවීමේදී පත්‍රික අලංකරණ ශාක තෝරා ගැනීමට ද හැකියාවක් පවතී. එවැනි ශාක වලින් අලංකාර ලෙස කප්පාදු කර ගැනීමෙන් හෝ කප්පාදු නොකර පවත්වා ගැනීමෙන් වුවද අලංකාරයක් ලබා ගත හැක. ඒ සඳහා උදාහරණ ලෙස Acalypha, Codiaeum, Graptophylum, Polyscias, Durantha, Evodia, Pseuderanthenum වැනි වූ ශාක තෝරා ගත හැක. මේවා සූර්යාලෝකය ප්‍රියකරන ශාක බැවින් හොඳින් සූර්යාලෝකය ලැබෙන ස්ථානවල පඳුරු, වැටවල්, බෝදර ලෙස සිටුවා ගැනීමෙන් අලංකාරයක් එක් කර ගත හැක.

හොඳින් සූර්යාලෝකය නොලැබෙන සෙවණ සහිත ස්ථාන සඳහා ශාක සිටුවීමේදී වඩාත්ම සැළකිලිමත් විය යුත්තේ තමන් තෝරා ගන්නා ශාකය 60%

- 70% සෙවනක් ප්‍රියකරන ශාක විය යුතු බවයි. එනම් Calathea, Aglaonema, Dracaena, Caladium, Colorophytum වැනි පඳුරු ලෙස වැඩෙන ශාක තෝරා ගෙන පාත්ති, බෝදර හෝ ගොමු ලෙස වගා කරමින් අලංකාරය වැඩි කර ගත හැකිය.


උද්‍යාන නිර්මාණ කටයුතු වලදී වැදගත් වන තවත් ශාකයක් වන්නේ මල් පිපෙන ගස්ය. මෙම ශාක ස්ථානගත කළ හැක්කේ තරමක් විශාලව විහිදුන භූමි සඳහාය. එනම් ශාක කිරුලක් ලබා ගැනීම හා මූල පද්ධතියට හොඳින් විහිදෙන ලෙස වැඩීමට සැලැස්විය යුතු භූමියකය. නමුත් මල් පිපෙන ගස් භාවිතා කිරීමේදී සමහර ශාක වසර පුරාම මල් පිපෙන අතර සමහර ශාක වසරේ කාලයකට මල් හට ගන්නා ශාක විය හැකිය. කෙසේ නමුත් මෙම ශාක දැකුම්කළු බැවින් තමන්ගේ වර්ණ හෝ හැඩ රුචිකත්වය මත මෙම ශාක හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මෙවැනි ශාක වලට උදාහරණ ලෙස Tabebuia, Delonix, Cassia, Amherstia, Saraca, Lagerstomia, Mesua, Browner වැනි ශාක සඳහන් කළ හැක. විශේෂයෙන් ඉඩම් සීමා වලට, සෙවන ලබා ගත යුතු ස්ථාන වලට අවධානය ලබා ගත යුතු ස්ථාන වලට මෙම ශාක තෝරා ගත හැකිය.


Graptophylum


Durantha


Dracaena


Codiaeum


Pseuderanthenum


Aglaonema


Polyscias


Colorophytum


Calathea


Caladium


Acalypha


Amherstia


Bahunia


Delonix


Lagerstomia


Cassia


Saraca



Copsia


Mesua


Caesalpinia


Tabebuia


Hamelia


Murriya

විශාල ශාක සිටුවීමට හැකියාව නොමැති ස්ථාන වලට මෙයට තරමක් විශාලත්වය අඩු ශාක ලෙස Bauhinia, Kopsia, Murriya, Hamelia, Caesalpinia වැනි ශාක වර්ග තෝරා ගනිමින් සීමා සහිත ඉඩකඩකට අවශ්‍ය සුන්දරත්වය ලබා ගැනීමට හැකියාවක් ඇත. මල් අලංකරණය නොමැතිව සෙවන පමණක් ලබාදෙන ශාක වර්ග ලෙස Azadrirechta, Filicium, Madhuea, Pterocarpus වැනි සෙවන ශාක භාවිතා කිරීමට හැකියාවක් පවතී.

උද්‍යාන අලංකරණය කටයුතු වලදී මල් ආරුක්කු හා මැසි භාවිතා කිරීමටද විශේෂයෙන් හැකියාවක් පවතී. එවැනි අවස්ථා වලදී භාවිතා කිරීමට අවශ්‍ය වන්නේ මල් පිපෙන හෝ විසිතුරු පත්‍රිකා වැල් වර්ගයි. ඒ සඳහා මල් පිපෙන වැල් වර්ග ලෙස Bauhinia, Saritaea, Tristellateia, Ipomoea, Thunbergia, Jasminum, Petrea වැනි අලංකාරක වැල් වර්ග භාවිතා කළ හැකියි.

සෙවන ස්ථාන වල වැවෙන වැල් වර්ග ලෙස Philodendron, Cissus, Monstera වැනි වැල් වර්ග සඳහන් කළ හැක. නමුත් නිර්මාණය කරන අංගය අනුව මෙම ශාක වර්ග තෝරා ගැනීම ද ඉතාම වැදගත් වේ.


Cissus



Thunbergia


Petrea


Monstera


Ipomoea


Tristellateia


Saritaea


Azadrirechta


Philodendron


Pterocarpus


Jasminum


Filicium

භූමි අලංකරණ කාර්යයන් ගැන සඳහන් කිරීමේදී විශාල ශාක වල කාර්යභාරය ඉතාම වැදගත් මීට අමතරව, වැටවල් ලෙස කප්පාදු කරන ශාක පඳුරු, බිම් ආවරණ ශාක, තෘණ පිටි සඳහා භාවිතා කරන වර්ග, තාල වර්ගයේ ශාක, උණ වර්ග, මීවන වර්ග, මඩු ශාක, වැටකේ ශාක, කේතුධර ශාක, ජලජ පැළෑටි වැනි විශාල පරාසයක ශාක භාවිතා කිරීමක් සිදුකරයි. කෙසේ නමුත් තම නිර්මාණයට අලංකාරයක් ලබා ගැනීමට නම්, වැදගත් වන්නේ තමන් තෝරා ගන්නා නිවැරදි උද්‍යාන අංගය හා නිවැරදි ශාකය බව පෙන්වා දිය හැකිය.

මෙවරත් තොරතුරු එක් කරන්නේ,

**චමින්ද රත්නායක,**
**කෘෂිකර්ම උපදේශක,**

**අධ්‍යාපන මධ්‍යස්ථානය,**
**රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය**